# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/43 – 2019 පෙබරවාරි 21 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, වතුමුල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/ඩබ්ලිව්එල්පී/2018/20 හා 2018.05.09 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 0.4446ක් පමණ වන පහත නම හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මුල්හල්කැලේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.4446ක් පමණ

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, ඇළ, එස්. එන්. කේ. වාසලගෙදර හිමිකම් කියන මුල්හල්කැලේවත්ත; දකුණට: එච්. එම්. ප්‍රියන්ත කුමාර, ඒ. වී. බන්දුමතී, ඩබ්. ජී. ඒ. ඩී. විතානගේ සහ ජී. ඒ. ආර්. ඩබ්. කේ. ගම්මන්පිල හිමිකම් කියන මුල්හල්කැලේවත්ත; බටහිරට: ජී. ඒ. ආර්. ඩබ්. කේ. ගම්මන්පිල හිමිකම් කියන මුල්හල්කැලේවත්ත, ඇළ සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2017/එල්ඕ/513.
2019 ජනවාරි මස 03 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 356


1A – G29517 – 21 (2019/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*